**Vidyodaya Journal of Humanities and Social Sciences**

VJHSS (2022), Vol. 07 (02)

# The Analysis of Indo- British -US Relations During the Period 2009-2019

M. R. K. Gayantha

Department of International Relations,University of Colombo, Sri Lanka

**Article Info**

Article History:
Received 09 Nov 2021
Accepted 24 Aug 2022
Issue Published Online
01 July 2022

**Key Words:**
Foreign policy of India
Indo-British-USA relations
Manmohan Singh policy
Modi policy
Neo classical realism theory

*Corresponding author
E-mail address:
kalanagayantha1997@gmail.com

https://orcid.org/0000-0002-4606-1808

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v07i02.14

VJHSS (2022), Vol. 07 (02), pp. 192-202

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

Faculty of Humanities and Social Sciences 2022

## ABSTRACT

*India is a major power in the Asian continent and hegemonic power in the south Asian region. India is a Strong member of International organizations such as SAARC, Commonwealth organization, the shanghai cooperation and BRICS. Manmohan Sing was the 13th prime minister of India. his second term was from 2019 may 22 to 2014 may 26. He is member of the Indian congress party. The leader of congress party was Sonia Gandhi. Narendra Modi was 14th prime minister of India. His first term was from 2014 may 26 to 2019 may 30. Britain and USA are India most friendly nations. This research seeks to comparatively analyze Indo-British- USA relations during 2nd term of Singh prime minister and the 1st term of Modi prime minister. The author evaluates to research objectives. The researcher will conduct research based on dual research objectives. First, studying of foreign policy of PM Singh & Modi. Second, studying of Indo-British-USA relations during the second term of PM Singh & first term of PM Modi. The author evaluates to broad research questions. First, What are the o foreign policies of PM Singh & Modi? . Second, What are the Indo-British-USA relations during the second term of PM Singh & first term of PM Modi? This research is study based an qualitative data. The researcher used to the secondary data for this research. This study utilized the secondary data from libraries and internet. The researcher used Neo classical realism theory for this research. Studies the country foreign policy and decision making process using Neo classical realism Theory. Recent research on India foreign policy has been minimal. This research is important for those studying Indian political and foreign policy.*

# 1. හැඳින්වීම

විදේශ ප්‍රතිපත්තියක් යනු අධිරාජ්‍යවාදී සමාජවාදී හෝ කොමියුනිස්ට්වාදී සෑම රටක් ම සිය අරමුණු ජාතික අභිලාෂයන් හරහා මුදුන්පත් කර ගැනීම යි (Neru, 1948). විදේශ ප්‍රතිපත්තියේ මූලික අරමුණ ජාතික අභිලාෂයන් මුදුන්පත් කර ගැනීම යි (Kamathi, 1990). කිසියම් රාජ්‍යයක් සෙසු රාජ්‍යන් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග විදේශ ප්‍රතිපත්තියක් වශයෙන් සරලව හැඳින්විය හැකිය. මෙකී ක්‍රියාමාර්ග කිසියම් රටක් විසින් අනුගමය කරනු ලබන අභ්‍යන්තර ප්‍රතිපත්තියේ කොටසක් වශයෙන් ද හඳුන්වා දිය හැක. මේ නිසා ඇතැම් ලේඛකයන් විසින් විදේශ ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇත්තේ රටක අභ්‍යන්තර ප්‍රතිපත්තියේ දීර්ඝ කිරීමක් වශයෙනි. එවැනි හැඳින්වීමක් වඩාත් සාධාරණ වන්නේ රටක අභ්‍යන්තර ප්‍රතිපත්තියේ මෙන් ම විදේශ ප්‍රතිපත්තියෙන් ද බලාපොරොත්තු වන්නේ එම රටේ ජාතික අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමයි. ඈත අතීතයේ මෙන්ම නූතන ලෝකය තුළ රාජ්‍යයන් අතර පවතින්නේ ඉතා සමීප සබඳතාවකි. නූතන තාක්ෂණික දියුණුව හා සන්නිවේදන මාධ්‍ය තුළින් අද ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත. මෙම හේතුව නිසා ලොව පුරා කිසිදු රාජ්‍යයන් සෙසු රාජ්‍යයන්ගෙන් වෙන්ව සිටීමෙන් හෝ හුදකලාව සිටීමෙන් පැවැත්මක් කර ගත නොහැකිය. ඒ අනුව නූතන රාජ්‍යයන් ඒ තරමට අන්‍යෝන්‍ය පැවැත්ම මත රඳා පැවැත්මක් බවට පත් වී ඇත. මෙම පැවැත්ම වූකලී බොහෝ දුරට ගොඩ නැගී ඇත්තේ දේශපාලන ආර්ථික සමාජීය සංස්කෘතික හෝ ඓතිහාසික ක්‍රියාවලීන් සමුදායක් මුල් කොටගෙනය. එම ක්‍රියාවලියන් මුල්කරගෙන රාජ්‍යයන් අතර ඇති වන්නා වූ අන්තර් ක්‍රියා, ප්‍රතික්‍රියා හේතුවෙන් රාජ්‍යයන් අතර පවත්නා සම්බන්ධතාව සමීප වීම හෝ දුරස් වීම සිදුවිය හැකිය. මිතුරු වීම හෝ සතුරු වීම සිදු විය හැකිය. මෙම සබඳතාවේ ස්වභාවය නිසැක වශයෙන් ම තීරණය වන්නේ කිසියම් රාජ්‍යයක් විසින් අනුගමනය කරන්නා වූ විදේශ ප්‍රතිපත්තියක් තුළිනි. ඉන්දියානු අග්‍රාමාත්‍ය නේරුගේ බලය යටතේ ඉන්දියාවේ පද්ධතිමය බාධා නොසලකා පරමාදර්ශී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට උත්සාහ කරන ලදී. මෙය පංචශීල ප්‍රතිපත්තිය මත පදනම් වූ විදේශ ප්‍රතිපත්තියක් වන අතර ඉන්දියාව නොබැඳි කඳවුරේ ද සාමාජිකයකු විය. තුෂ්ණී යුධ සමයේ දී ඇමරිකාව හා සෝවියට් කඳවුර යන ප්‍රධාන බලකඳවුරු දෙකට අයත් නොවන නොබැඳි කඳවුරෙහි කටයුතු කරමින් මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. ඉන්දියාව තුෂ්ණී යුධ සමයෙ දී ජාත්‍යන්තර දේශපාලනය තුළ සුවිශේෂී භූමිකාවක් ඉටු කරන ලද පාත්‍රයකි. ඉන්දියාවට කලාපීය රාජ්‍යයන් සමඟ පවතින දේශසීමා සහ නාවික ගැටලු මෙන් ම සංස්කෘතික ගැටලු දශක කිහිපයක් තුළ විදේශ ප්‍රතිපත්තියට එල්ල වූ ප්‍රධාන අභියෝගයන් විය. ඉන්දියාව තුෂ්ණී යුද්ධය බිඳ වැටීමෙන් පසු ආසියාවේ නැගී එන බලවතකු වන චීනය සමඟ උරෙන් උර ගැටෙමින් කලාපයේ සෙසු රාජ්‍යයන් සමග සබඳතා පවත්වමින් ජාත්‍යන්තර පද්ධතිය තුළ ප්‍රබල පාත්‍රයකු වීමට උත්සාහ දරමින් සිටී. ඉන්දියාවේ දහතුන්වන අග්‍රාමාත්‍යවරයා වන මන්මෝහන් සිං 2004 අගමැති ධූරයට පත් වූ අතර ඔහුගේ දෙවනධූර කාල පරිච්ඡේදය 2009 මැයි 22 සිට 2014 මැයි 26 දක්වා ක්‍රියාත්මක විය. ඔහු ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා වුව ද පාලක කොංග්‍රස් පක්ෂයේ නායකත්වය දරනු ලැබුවේ සෝනියා ගාන්ධි විසිනි.

ඉන්දියාවේ දාහතර වන අගමැතිවරයා වන නරේන්ද්‍ර මෝදි 2014 මැයි 26 වන දින අගමැති ධූරයට පත් වූ අතර ඔහුගේ පළමුවන ධූර කාල පරිච්ඡේදය 2019 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. ඔහු භාරතීය ජනතා පක්ෂ සන්ධානයට නායකත්වය ලබා දුනි. ඉන්දියාව, බ්‍රිතාන්‍යය මෙන් ම ඇමරිකාව ජාත්‍යන්තර පද්ධතිය තළ හිත මිතුරු රාජ්‍යයන් වන අතර ඔවුන් තම බලය උදෙසා එකිනෙකා ආර්ථික, සමාජීය, දේශපාලනික හා සංස්කෘතික සබඳතා පවත්වනු ලබයි. ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්තිය සකස් වීම කෙරෙහි බ්‍රිතාන්‍ය සහ ඇමෙරිකානු සබඳතා දායක වී ඇති ආකාරය මන් මෝහන් සිං අග්‍රාමාත්‍යවරයාගේ දෙවන ධූර කාල පරිච්ඡේදය මෙන් ම අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතාගේ පළමුවන ධූර කාල පරිච්ඡේදය තුළින් සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කරයි.

## 1.1 පර්යේෂණ පසුබිම

මෙම පර්යේෂණය මගින් ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්තීන්වල පවතින වෙනස්කම් සහ අග්‍රාමාත්‍ය මන්මෝහන් සිං සහ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ ධූර කාල පරිච්ඡේදයන් තුළ ඉන්දු බ්‍රිතාන්‍ය ඇමෙරිකානු සබඳතා සකස් වී ඇති ආකාරය අධ්‍යයනය කිරීමට පර්යේෂකයා අපේක්ෂා කරයි. මෙහි දී පර්යේෂකයා ඉන්දු - බ්‍රිතාන්‍ය සබඳතා ආර්ථික දේශපාලන හා සංස්කෘතික යන කාණ්ඩ ත්‍රිත්වයක් යටතේ අගමැති ආචාර්ය සිං සහ අගමැති මෝදිගේ ධූර පරිච්ඡේදවලට අදාළව වෙන් වෙන්ව අධ්‍යයනය කිරීමට පර්යේෂකයා අපේක්ෂා කරන අතර ඉන්දු ඇමරිකානු සබඳතා ද ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යන කාණ්ඩ ත්‍රිත්වය යටතේ අග්‍රාමාත්‍ය ආචාර්ය සිං සහ අගමැති මෝදිගේ ධූර කාල පරිච්ඡේදයන්වලට අදාළව වෙන් වෙන්ව අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරයි. ඉන්දියාව ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ලෙස පිළිගන්නා අතර ඉන්දියාව පොදු රාජ්‍ය මණ්ඩලය,සාර්ක් සංවිධානය, බ්‍රික්ස් සංවිධානය, ෂැන්හයි සහයෝගිතා සංවිධානය, ඉන්දියානු සාගර කලාපයේ සංවිධානය වැනි ප්‍රබල ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය දරන රාජ්‍යයක් වේ. ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම මගින් දකුණු ආසියානු කලාපයේ මෙන් ම ආසියානු කලාපයේ ජාත්‍යන්තර

දේශපාලන භූමිකාව පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. ඉන්දියාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්විජිතයක් වූ අතර ඉන්දියාව පොදු රාජ්‍ය මණ්ඩලයේ සක්‍රීය සාමාජිකයකු වන බැවින් ඉන්දු බ්‍රිතාන්‍ය සබඳතා දකුණු ආසියානු කලාපයේ දේශපාලන භූමිකාව නිර්මාණය වීමට ද හේතු සාධකයක් වී ඇත. දකුණු ආසියානු කලාපයේ රාජ්‍යයන් වෙත චීනය වෙළඳ කටයුතු සහ දේශපාලනය කෙරෙහි ඇති කරන්නා වූ බලපෑම් ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්තියට අභියෝගයක් වී ඇත. එවැනි ජාත්‍යන්තර ගැටලුවක් පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම කාලීන වැදගත් ප්‍රස්තුතයකි. ජයදේව උයන්ගොඩ දක්වන ආකාරයට පර්යේෂණයක වැදගත්කම අංශය ත්‍රිත්වයකින් හඳුනා ගත හැකිය.

එනම් න්‍යායික වැදගත්කම, අර්ථ භාවිතය වැදගත්කම, හා ආනුභවික වැදගත්කමයි (Uyangoda, 2016). මාගේ පර්යේෂණයට අයත් වන්නේ අර්ථ භාවික වැදගත්කම යි. එනම් එකතු කරගන්නා දත්ත මත පදනම්ව සමාජය ලෝකය පිළිබඳ අර්ථකථනාත්මක විග්‍රහයක් හා තර්කයන් ඉටු කිරීමට මේ මගින් අපේක්ෂිතය (Uyangoda, 2016).

## 1.2 ගැටලු ප්‍රකාශනය

ඉන්දියාව දකුණු ආසියානු කලාපයේ බලවතා වන අතර බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව අතර සමග ධනාත්මක සම්බන්ධතාවක් පවත්වා ගෙන යනු ලබයි.ඉන්දියානු අග්‍රාමාත්‍ය ආචාර්ය මන්මෝහන් සිං ඉන්දියානු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ ධුර කාල පරිච්ඡේදවල දී ඉන්දියාව බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව සමග සබඳතාවන් ගෙන ගිය ආකාරය විශ්ලේෂණාත්මක අධ්‍යයනය කිරීම

## 1.3 පර්යේෂණයේ අරමුණු

1. අග්‍රාමාත්‍ය මන්මෝහන් සිං සහ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ විදේශ ප්‍රතිපත්තීන් අධ්‍යයනය කිරීම.

2. 2009 සිට 2019 දක්වා ඉන්දියාව බ්‍රිතාන්‍යය සහ ඇමෙරිකාව සමග විදේශ සබඳතා පවත්වාගෙන ගිය ආකාරය අධ්‍යයනය කිරීම

## 1.4 පර්යේෂණ ප්‍රශ්න

1. අග්‍රාමාත්‍ය මන්මෝහන් සිං ගේ හා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ විදේශ ප්‍රතිපත්තීන් කවරේ ද?

2. 2009 සිට 2020 දක්වා ඉන්දියාව බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව සමග විදේශ සබඳතා පවත්වා ගෙන ගිය ආකාරය කෙබඳු ද ?

## 1.5 න්‍යාය හා සංකල්ප

### නව සම්භාව්‍ය යථාර්ථවාදය (Neo Classical Realism)

ඉහත න්‍යාය උපයෝගී කරගනිමින් ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග, ගනු ලබන ලද තීරණ, මෙන්ම තීරණ ගැනීමේ දී අවධානයට යොමු කරන සාධක අධ්‍යයනය කරනු ලබයි. ඒ අනුව නව යථාර්ථවාදයට අනුව ජාත්‍යන්තර පද්ධතිය සකස් වී ඇත්තේ ආරක්ෂාව මූලික කරගත් ඒකීය තාර්කික රාජ්‍යයන්ගෙනි. මෙහි දී ඉන්දියාව බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව සමග විදේශ සබඳතා පැවැත්වීමේ දී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග මේ හරහා අධ්‍යයනය කිරීම්ට අපේක්ෂා කරයි. මෙහි දී ඉන්දියාවේ අභ්‍යන්තර මෙන් ම බාහිර චර්යාව මෙම න්‍යාය හරහා විශ්ලේෂණය කිරීමට පර්යේෂකයා අපේක්ෂා කරයි. Grdeon Rose විසින් 1998 දී නව සම්භාව්‍ය යථාර්ථවාදය හඳුන්වා දුන් අතර මෙය ඇමෙරිකානු ගුරුකුලයකි. නව සම්භාව්‍ය යථාර්ථවාදීන් ප්‍රකාශ කරනුයේ යම් රටක විදේශ ප්‍රතිපත්තියේ වපසරිය සහ අරමුණ තීරණය කරනු ලබන්නේ රාජ්‍යය විසින් ජාත්‍යන්තර පද්ධතිය තුළ හිමි කරගෙන ඇති ස්ථානය හා රාජ්‍යය සතු සාපේක්ෂ බලය මත පදනම් කර ගනිමින් බවයි. ජාත්‍යන්තර පද්ධතිය තුළ රාජ්‍යය විසින් හිමිකර ගන්නා ස්ථානය සහ බාහිර හා අභ්‍යන්තර සාධක මෙහි දී සලකා ගත් අයුරු පරීක්ෂා කර බලනු ලැබේ. මෙහි දී නව සම්භාව්‍ය යථාර්ථවාදය රටේ පද්ධතිමය, අභ්‍යන්තර හා පුද්ගලානුබද්ධයන් විචල්‍යයන් ත්‍රිත්වය යටතේ විශ්ලේෂණය කෙරේ. මෙහි දී ඉන්දියාව බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව සමග විදේශ සබඳතා පැවැත්වීමේ දී අභ්‍යන්තර විචල්‍ය ලෙස ඉන්දියානු රජය සහ පාලක පක්ෂයේ භූමිකාව ද පුද්ගලානුබද්ධ ලෙස ඉන්දියානු අග්‍රාමාත්‍යවරුන්ගේ භූමිකාව ද පද්ධතිමය විචල්‍ය ලෙස ජාත්‍යන්තර පද්ධතියෙන් ඒ වන විට පැවති ස්වභාවය සහ දකුණු ආසියානු කලාපය තත්ත්වය ද සලකා බැලේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ නිබන්ධනය සිදු කිරීමේ දී එයට අවශ්‍ය තොරතුරු රැස් කිරීමට පර්යේෂණ ක්‍රමවේදයන් හරහා දත්ත රැස් කිරීම සිදු කරයි. පර්යේෂණ නිබන්ධනයට තොරතුරු රැස් කිරීමට ක්‍රමවේදය හා විධික්‍රම අවශ්‍ය වන්නේ දත්ත රැස්කිරීමට හා අර්ථකථනය කිරීමට යි (Uyangoda, 2016). දත්ත රැස් කිරීම සඳහා ක්‍රමවේදයන් හතරක් පවතී. එහි දී දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක දත්ත, ප්‍රමාණාත්මක දත්ත, ප්‍රාථමික දත්ත ද්වීතයික දත්ත යන ක්‍රමවේදයන් හතර උපයෝගී කර ගනී. පර්යේෂකයා මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක ප්‍රවේශය උපයෝගී කර ගන්නා අතර, මෙහි දී ගුණාත්මක දත්ත ලෙස අන්තර්ජාලයෙන් ලබා ගන්නා වාර්තා ඉන්දියානු විදේශ කටයුතු

අමාත්‍යාංශයේ වාර්තා උපයෝගී කර ගැනීමට කටයුතු කර ඇත. මෙම පර්යේෂණ සිදුකිරීමට ගුණාත්මක දත්ත උපයෝගී කර ගැනීමට පර්යේෂකයා කටයුතු කර ඇත. මෙහි දී පර්යේෂකයා දත්ත එක් රැස් කර ගැනීම සඳහා ද්විතීයික දත්ත මූලාශ්‍රයන් භාවිත කර ඇත. ද්විතීයික දත්ත මූලාශ්‍රයන් ලෙස පුස්තකාල තොරතුරු අන්තර් ජාලය උපයෝගී කරගෙන ඇත.

## 2.1 පර්යේෂණ සීමාවන්

පර්යේෂකයා මෙහි දී අග්‍රාමාත්‍ය මන්මෝහන් සිංගේ දෙවන ධුර කාලයේ දී පරිච්ඡේදය එනම් 2009-2014 දක්වා ද අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ පළමු ධුර කාල පරිච්ඡේදය එනම් 2014- 2019 දක්වා කාලය තුළ ඉන්දු බ්‍රිතාන්‍ය ඇමෙරිකානු සබඳතා අධ්‍යයනය කරනු ලබයි. මෙම සබඳතා අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂකයා නව සම්භාව්‍ය යයථාර්ථවාදය (Neo Classical Realism) න්‍යාය උපයෝගී කර ගනී. මෙහි දී පර්යේෂකයා පර්යේෂණය තුළ දී ගුණාත්මක දත්තවලට පමණක් අවධානය යොමු කර ඇති අතර දී ද්විතීයික දත්ත මූලාශ්‍ර මේ සඳහා උපයෝගී කරගෙන ඇත. කොවිඩ් වසංගතය නිසා පර්යේෂකයාට දත්ත රැස් කිරීමේ දී සීමාවෙන් පැනවෙන අතර එම නිසා පර්යේෂකයා දත්ත ලබා ගැනීම සඳහා ප්‍රධාන මෙවලමක් ලෙස අන්තර්ජාලය හා පුස්තකාල පහසුකම් උපයෝගී කරගෙන ඇත.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ඉන්දු බ්‍රිතාන්‍යය ආර්ථික සබඳතා

ඉන්දු බ්‍රිතාන්‍ය විදේශ සබඳතා ඉහත රාජ්‍යයන් ද්විත්වය පදනම් කරගනිමින් ආර්ථික සබඳතා දේශපාලන හා මිලිටරිමය සබඳතා ලෙස වෙන් වෙන්ව සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කරයි. මන්මෝහන් සිං රජයේ දෙවන ධුර කාල සමය තුළ පැවැති බ්‍රිතාන්‍ය ඉන්දු වෙළෙඳ සබඳතා පිළිබඳ අදහස් දක්වන විද්වතකු ප්‍රකාශ කර සිටියේ ඉන්දියාවේ ආර්ථිකය නැගීම හමුවේ බ්‍රිතාන්‍යය ඉන්දියාවට ආධාර ලබාදීමට නායකත්වය ලබා දුන් බවයි (ස්කොට්, 2017). මා ඉහත ප්‍රකාශයට එකඟ වන අතර 2013 වර්ෂයේ බ්‍රිතාන්‍ය ගාඩියන් පුවත්පතට අනුව ඉන්දු බ්‍රිතාන්‍ය වෙළඳ සබඳතාවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 3.9 දක්වා වර්ධනය විය. 2013 වන විට ඉන්දියාවේ තෙවන විශාලතමතම වාණිජ සහකරුවා බවට බ්‍රිතාන්‍යය පත්විය (BBC News, 12 November 2015). එකල බ්‍රිතාන්‍ය ආර්ථිකයට සෘජු දායකත්වයක් ඉන්දියානු සමාගම් ලබා දී තිබූ අතර බ්‍රිතාන්‍යයේ පිහිටි ඉන්දියානු ටාටා කර්මාන්ත ශාලාව ශ්‍රමිකයන් 60,000කට ආසන්න පිරිසකට රැකියාවන් උත්පාදනය කර තිබේ. බ්‍රිතාන්‍ය ඉන්දු වෙළඳ සබඳතාවල ධනාත්මක වර්ධනයක් තිබූ බවට ප්‍රබල සාක්ෂියක් නම් 2013 වර්ෂයේ ඉන්දියාවේ සිට බ්‍රිතාන්‍යය අපනයනය කළ භාණ්ඩවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 2792 වූ අතර බ්‍රිතාන්‍යයේ සිට ඉන්දියාවට ආනයනය කළ වෙළෙඳ භාණ්ඩවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 2360 එකක් විය (CMIE data report, 2013). 2013 වසරේ දී ඉන්දියාවේ සංචාරකයක යෙදුන බ්‍රිතාන්‍ය අගමැති කැමරන් ප්‍රකාශ කර සිටියේ ඉන්දියාවට පැමිණි විට මා තර්ක කරනුයේ නවීන හවුල්කාරීත්වය ගොඩනගා ගැනීමට හැකි බවයි (කැමරන්, 2013). කැමරන් 2019 වසරේ රචනා කරන ලද For the record නම් ස්වයං චරිතාපදාන ග්‍රන්ථය තුළ දී මන්මෝහන් සිං අවධියේ වෙළඳ සබඳතාවල වර්ධනයක් සිදු වූ බවට දක්වා තිබේ. මාගේ අදහස නම් බ්‍රිතාන්‍යය ඉන්දියාව සමග නව වෙළෙඳ සබඳතා ඇති කර ගැනීම තුළින් දකුණු ආසියානු කලාපයේ සහ ඉන්දියානු සාගර කලාපයේ වෙළඳ කේන්ද්‍රය වෙත බ්‍රිතාන්‍යය තුළ ඇති කැමැත්ත නිරීක්ෂණය වන බවයි. තව ද ඉන්දියාව චීන වෙළඳ මූලෝපායික සැලසුම්වලට අභියෝග කිරීම උදෙසා ආචාර්ය සිං බ්‍රිතාන්‍යය සමඟ නව වෙළෙඳ සබඳතා ඇති කර ගත් බවත් කලාපයේ ආර්ථික සංවර්ධනය උදෙසා බ්‍රිතාන්‍යයේ දායක කර ගැනීම සිදුකළ බව මාගේ අදහස යි.

මෝදි අගමැතිවරයාගේ යුගයේ බ්‍රිතාන්‍යය ඉන්දියානු විදේශ සබඳතා පිළිබඳ අදහස් දැක් වූ විද්වතකු ප්‍රකාශ කර සිටියේ එක්සත් රාජධානිය ඉන්දියාවේ ආර්ථික කොරිඩෝව හරහා දකුණු ආසියාවට ප්‍රවේශ වී ව්‍යාපාර පුළුල් කර ගැනීමට උත්සාහ කරන බවයි (Nandi, 2021). 2015 වසරේ බ්‍රිතාන්‍ය සංචාරයට පෙර මෝදි ප්‍රකාශ කර සිටියේ එක්සත් රාජධානිය වෙත පිටත් වීමට බලාපොරොත්තු වන බවත් මෙම සංචාරයේ දී ආර්ථික සබඳතා ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන බවයි (Indiatvnews, 12 November 2015). මාගේ අදහස නම් මෙහි දී මෝදි අපේක්ෂා කරනුයේ බ්‍රිතාන්‍යය සමග ධනාත්මක වෙළඳ සබඳතා ඇති කර ගැනීම තුළින් බ්‍රිතාන්‍යය තුළ වාසය කරන මිලියන 1.5 වන ඉන්දියානු ඩයස්පෝරාව මෝදිගේ ජාතිකවාදී ප්‍රතිපත්තීන් හරහා තම පාලනය වෙත ආකර්ෂණය කර ගෙන ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීම යි. බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම පිළිබඳ ජනමත විචාරණයක් පැවැත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බ්‍රෙක්සිට් ක්‍රියාවලිය හරහා බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීමට සැලසුම් සකස් කරන ලදී. මාගේ අදහස නම් මෙය මෝදි බ්‍රිතාන්‍යය පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා හේතු වූ සුවිශේෂී කාරණාවක් වන අතර මෙහි දී බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීමෙන් පසු ඉන්දියාව බ්‍රිතාන්‍යයේ ප්‍රධාන වෙළඳ ගනුදෙනුකරුවෙක් බවට පත්වීමටත් බ්‍රිතාන්‍ය ආයෝජන ඉන්දියාව වෙත ආකර්ෂණය කර ගැනීම ද අරමුණු විය. 2016 වසරේ මෝදිගේ එක්සත් රාජධානිය සංචාරය අතරතුර Wembly ක්‍රීඩාංගනයේ සහ Millennium dome පැවැති ඉන්දීය ඩයස්පෝරාව සමග පැවැති සුහද හමුවලට බ්‍රිතාන්‍ය අගමැති කැමරන් ද සහභාගි විය. මෙහි දී කැමරන්

ප්‍රකාශ කරනු ලැබුවේ බ්‍රිතාන්‍යයේ බොහෝ සාර්ථක ව්‍යාපාරික චරිත ඉන්දියානු ඩයස්පෝරාවෙන් පැමිණි අය බවත් ඔවුන් බ්‍රිතාන්‍යයේ ආර්ථිකයේ විශාල ආයුධයක් බවට පත්ව ඇති බවයි (කැමරන්, 2019). ඒ අනුව බ්‍රිතාන්‍ය රජය ද ඉන්දියානු රජය සමග වෙළඳ සබඳතා පැවැත්වීම උදෙසා කැමැත්තකින් පසු වූ බව නිරීක්ෂණය වේ.

කැමරන්ගෙන් පසු පැමිණි බ්‍රිතාන්‍ය අගමැති තෙරේසා මේ 2016 නොවැම්බර් මස ඉන්දීය සංචාරයේ දී ඉන්දු බ්‍රිතාන්‍ය වෙළඳ සබඳතා කෙරෙහි ප්‍රධාන අවධානයක් යොමු කළ අතර, ඉන්දීය කර්මාන්ත හා වාණිජ අමාත්‍ය නිර්මලා සීතාරාමන් හමු වී දෙරටේ ආර්ථික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡා කරන ලදී. 2019 අවසන් වන විට ඉන්දියාවේ සිට බ්‍රිතාන්‍යයට සිදුකරනු ලැබූ අපනයනවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 6604 ක් වූ අතර බ්‍රිතාන්‍යයේ සිට ඉන්දියාවට කළ ආනයනවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 3918 ක් දක්වා වර්ධනය විය (CMIE data report, 2020).

ආචාර්ය සිංගේ දෙවනධුර කාල පරිච්ඡේදය හා මෝදිගේ ප්‍රථමධුර කාල පරිච්ඡේදයන් ද්විත්වයේ ඉන්දියානු බ්‍රිතාන්‍ය ආර්ථික සබඳතා පිළිබඳ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ ආචාර්ය සිංගේ කාල පරිච්ඡේදය මෙන් ම මෝදිගේ කාලපරිච්ඡේදය බ්‍රිතාන්‍ය සහ ඉන්දියානු ආර්ථික සබඳතා ධනාත්මක තත්වයක පසු වූ බවයි. නමුත් ආචාර්ය සිංට වඩා මෝදි අගමැතිවරයා බ්‍රිතාන්‍යයේ වෙසෙන ඉන්දියානු ඩයස් පෝරාව සිය රටේ ආර්ථික සංවර්ධනයට ද දායක කර ගැනීම සඳහා දැඩි උත්සාහයක් ගත් අතර, ඒ සඳහා මෝදිගේ ජාතිකවාදී ප්‍රතිපත්ති ද රුකුලක් විය. බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වීමේ ක්‍රියාවලියෙන් පසු බ්‍රිතාන්‍යයේ ප්‍රධාන වෙළෙඳ සහකරුවකු බවට පත්වීමට මෝදිගේ රජය උත්සාහ කරන ලදි. මෝදිගේ එම ආර්ථික සැලසුම් ආචාර්ය සිංගේ රජයට වඩා ඉන්දු බ්‍රිතාන්‍ය ආර්ථික සබඳතා ධනාත්මක වර්ධනයකට ගෙන යාමට හේතු සාධක විය.

### 3.2 ඉන්දු බ්‍රිතාන්‍ය දේශපාලන හා මිලිටරි සබඳතා

ආචාර්ය සිංගේ දෙවන ධූරකාල පරිච්ඡේදය තුළ පැවැති බ්‍රිතාන්‍ය ඉන්දියානු දේශපාලන හා මිලිටරි සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී For the record නම් කැමරන්ගේ ස්වයං චරිතාපදාන ග්‍රන්ථය තුළ මං මෝහන් සිං අගමැතිවරයා පිළිබඳ දක්වා ඇත්තේ ඔහු සමග හොඳින් ඇසුරු කළ අතර, ඔහු සාන්තුවරයකු වූ නමුත් ඉන්දියාවට මුහුණ දෙන තර්ජන කෙරෙහි ඔහු දැඩි ලෙස නැගී සිටි බවයි (කැමරන්, 2019). මෙම ප්‍රකාශය දෙස අධ්‍යයනය කිරීමේ දී නිරීක්ෂණය වන කාරණය නම් අගමැති කැමරන් ආචාර්ය සිංගේ දේශපාලන ආකල්ප පිළිබඳ යහපත් තතත්වයක පසු වූ බවයි. 2011 වසරේ ඉන්දියානු මුම්බායි නුවරට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යය පාකිස්තානයට ඍජුව චෝදනා එල්ල කරන ලදී. 2011 වසරේ ඉන්දියාවට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පාකිස්තානය වගකිව යුතුයි (කැමරන්, 2019). තව ද බ්‍රිතාන්‍ය අගමැති කැමරන් ප්‍රකාශ කර සිටියේ පාකිස්තානය ත්‍රස්තවාදය පෝෂණය නොකළ යුතු බවයි (කැමරන්, 2019). මාගේ අදහස නම් මෙහි දී කැමරන් උපක්‍රමශීලීව දකුණු ආසියානු කලාපය වෙත ප්‍රවේශ වීම සඳහා ඉන්දියාව උපයෝගි කරගත් බවත් මෙහි දී ඉන්දියාවේ සතුරා වන පාකිස්තානය විවේචනය කිරීම මගින් ඉන්දියාව තමන් වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා උත්සාහ කළ බවයි.

මෙහි දී ඉන්දීය කලාපයේ අනෙකුත් රාජ්‍යයන් වෙත දැක් වූ ප්‍රතිචාරය බ්‍රිතාන්‍ය කලාපයේ අනිකුත් රටවල් සමඟ පවතින සබඳතාවලට බාධාවක් නොකර ගත් බව මාගේ අදහස යි. 2013 ශ්‍රී ලංකාවේ පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව ආචාර්ය සිං වර්ජනය කළ නමුත් අගමැති කැමරන් ඒ සඳහා සහභාගිවීම තුළින් මා ඉහත දැක් වූ අදහස සනාථ වේ.

මෝදි අගමැතිවරයාගේ පළමු ධුර කාලය තුළ ඉන්දු බ්‍රිතාන්‍ය දේශපාලන සබඳතාවන් අධ්‍යයනය කිරීමේ දී 2015 නොවැම්බර් 12 වන දින මෝදිගේ බ්‍රිතාන්‍ය සංචාරය සුවිශේෂී වනුයේ මෝදිගේ කැරිස්මා පෞරුෂත්වය හා ජාතිකවාදී දේශපාලන දැක්ම සඳහා බ්‍රිතාන්‍යයේ සිටින ඉන්දියානු ඩයස්පෝරාව විසින් උණුසුම් ප්‍රතිචාර දැක්වීම යි. මෝදි පිළිගැනීමට ඉන්දියානු ඩයස්පෝරාව ක්‍රීඩාංගනයේ සංවිධානය කර තිබූ උත්සවය පිළිබඳ අගමැති කැමරන් සිය ස්වයං චරිතාපදාන ග්‍රන්ථයේ දක්වා ඇත්තේ මෝදි මහතා හඳුන්වා දීමට පෙර ක්‍රීඩාංගණයට රැස්ව සිටින 60,000ක පමණ ජනකායක් දැක සතුටු වුනෙමි යනුවෙනි (කැමරන්, 2009). මෝදිගේ අභ්‍යන්තර සංවර්ධන ප්‍රතිපත්ති උදෙසා කැමරන්ගේ සහය හිමිවිය. මෝදිගේ රජයේ ගංගා පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියට දායක වීමට කැමරන් කැමැත්ත පළ කරන ලදී (Wolkar, 2015). මෝදිගේ බ්‍රිතාන්‍ය සංචාරය තුළ දී දෙරටේ ආරක්ෂක සහයෝගීතාව වැඩි දියුණු කිරීම පිළිබඳ විශේෂ අවධානය යොමු විය. මාගේ අදහස නම් මෝදි කලාපීය සතුරන් හා ත්‍රස්තවාදී තර්ජන පිටුදැකීම සඳහා බ්‍රිතාන්‍යය සමග නව ආරක්ෂක සහයෝගිතාවන් ඇති කරගත් බවයි. මෙම බ්‍රිතාන්‍ය සංචාරය තුළ දී ඉන්දියාවට අවශ්‍ය බ්‍රිතාන්‍යයේ රැඳී සිටින Hanif, Ravi Shankaran, Remansi Warli වැනි අපරාධකරුවන් නැවත ඉන්දියාවට පිටුවහල් කරන ලෙස කැමරන්ගෙන් ඉල්ලා සිටින ලදී (Hindusthan Times, 27 June 2015). එහි දී මෝදි විදේශ සබඳතාවල දී ඉන්දියාවේ අභ්‍යන්තර ආරක්ෂාව සඳහා මූලික තැනක් ලබාදුන් බව පැහැදිලි වේ. ඒ අනුව ඉහත දැක් වූ සාධකවලට අනුව මා හට නිරීක්ෂණය වන කාරණය නම්

මෝදිගේ දේශපාලන චින්තනය කෙරෙහි අගමැති කැමරන් දැඩි කැමැත්තක් දැක් වූ බව දක්නට ලැබේ.

කැමරන්ගෙන් පසු බ්‍රිතාන්‍ය අගමැති ධුරයට පත් වූ තෙරේසා මේ ඉන්දියානු සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි දැඩි උනන්දුවක් දැක් වූ බව නිරීක්ෂණය වේ. තෙරේසා මේ 2016 නොවැම්බර් 13 වන දින ඉන්දියාවේ සංචාරය කළ අතර, එහි දී ඉන්දු බ්‍රිතාන්‍ය සබඳතා වර්ධනය කර ගැනීම පිළිබඳ සාකච්ඡාවන් පවත්වන ලදී. ඇයගේ සංචාරය තුළ සිදු වූ සුවිශේෂී කරුණක් නම් තෙරේසා මේ දකුණු දිග බැංගලෝරයේ ඉන්දීය කෝවිලකට ඉන්දියානු සාම්ප්‍රදායික සාරියකින් සැරසී සහභාගි වීමයි (Shauley, 2016) මාගේ අදහස නම් ඇය රාජ්‍යතාන්ත්‍රික සංචාරය අතරතුර මෘදු බලය උපයෝගී කර ගනිමින් ඉන්දියානු ජනතාව හා දේශපාලන ප්‍රජාව තමන් වෙත ආකර්ෂණය කර ගැනීමට උත්සාහ කළ බවයි. තෙරේසා මේ අවධිය තුළ බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වීමේ බ්‍රෙක්සිට් ක්‍රියාවලියෙහි නිරත වූ අතර යුරෝපා සංගමයෙන් බ්‍රිතාන්‍යය ඉවත් වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ ප්‍රබල ආරක්ෂක, දේශපාලන හා ආර්ථික සහකරුවකු බවට ඉන්දියාව පත්කිරීමට මෝදි තුළ උපක්‍රමශීලී සැලසුමක් පැවැති බව මාගේ අදහසයි. එම සැලසුම් සාක්ෂාත් කර ගැනීම සඳහා මෝදී සිය ජාතිකවාදී දේශපාලන චින්තනය හා ඉන්දීය ඩයස්පෝරාවේ සහාය උපයෝගී කරගත් බව නිරීක්ෂණය වේ.

මේ අනුව මෝදි සහ බ්‍රිතාන්‍ය රජය අතර පැවති විදේශ සබඳතා Keneth Waltz ගේ Level Of Analysis විශ්ලේෂණය කිරීමේ දී international level අනුව ඉන්දීය ඩයස්පොරාවේ බලපෑම හා බ්‍රිතාන්‍ය බ්‍රෙක්සිට් ක්‍රියාවලිය බ්‍රිතාන්‍යය සමග සබඳතාව වර්ධනය කර ගැනීම සඳහා මෝදී උපක්‍රමශීලීව උපයෝගී කරගත් අතර Individual Level අනුව විශ්ලේෂණය කිරීමේ දී මෝදි සතුව පැවති ජාතිකවාදී දේශපාලන චින්තනය හා මිත්‍රශීලී දේශපාලනික ආකල්ප බ්‍රිතාන්‍ය ඉන්දීය සබඳතා ධනාත්මක පැතිකඩක් වෙත පරිවර්තනය කිරීමට සමත් විය. බ්‍රිතාන්‍ය අගමැති කැමරන්ගේ ස්වයං චරිතාපදාන ග්‍රන්ථය තුළ දී මෝදිගේ දේශපාලන චින්තනය අගය කිරීම මගින් හා තෙරේසා මේ අගමැතිවරිය ඉන්දියාවට පැමිණි අවස්ථාවේ දී ඉන්දීය සාම්ප්‍රදායික සාරියකින් සැරසී ඉන්දීය කෝවිලකට සහභාගි වීම වැනි සිදුවීම් මගින් මෝදි බ්‍රිතාන්‍ය පාලකයින් තම දේශපාලන චින්තනය හරහා තමන් වෙත ආකර්ශණය කරගත් බව පැහැදිලි වේ. මාගේ මතය නම් ආචාර්ය සිංගේ දෙවන ධුර කාල පරිච්ඡේදයට වඩා මෝදිගේ පළමු ධුර කාල පරිච්ඡේදය තුළ ඉන්දු බ්‍රිතාන්‍ය සබඳතා ධනාත්මක අයුරින් වර්ධනය වූ බවයි. ආචාර්ය සිං අවධියේ දී ඉන්දියානු සිසුන්ට බ්‍රිතාන්‍ය අධ්‍යාපනික වීසා ලබා දීම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වූ අතර එවක බ්‍රිතාන්‍යයේ ඉන්දියානු නියෝජ්‍ය මහකොමසාරිස් දිනේෂ් පට්නායික් ප්‍රකාශ කළේ 2010 සිට එක්සත් රාජධානියේ අධ්‍යාපනය හැදෑරීමට ඉන්දියානු සිසුන්ට ලබා දී තිබෙන අවස්ථා බ්‍රිතාන්‍යය විසින් සීමා සහිත කර ඇති බවයි. නමුත් මෝදි සිය පළමු ධුරකාල පරිච්ඡේදය තුළ දී එම ගැටලුව බ්‍රිතාන්‍යය සමග සුහදශීලී සාකච්ඡා මගින් විසඳා ගැනීමට සමත් විය. තෙරේසා මේ අගමැතිණිය ඉන්දියාවට පැමිණි අවස්ථාවේ දී ප්‍රකාශ කළේ අප බ්‍රිතාන්‍ය සරසවිවලට ඉන්දියාවේ සිසුන් අඛණ්ඩව ඇතුළත් කර ගැනීමට බලාපොරොත්තු වන බවයි (Shauley, 2016). ආචාර්ය සිං සිය අවසාන ධුර කාල පරිච්ඡේදය තුළ දී 2013 ශ්‍රී ලංකාවේ පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සහභාගි වීමෙන් වැළකුණ ද මෝදි පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවලට සහභාගී විය.

ආචාර්ය සිංට විදේශ ප්‍රතිපත්තින් පිළිබඳ තීරණ ගැනීමේ දී දේශීය විචල්‍යයන්ට ප්‍රමුඛත්වයක් දීමට සිදුවිය. එයට හේතුව වූයේ පාලක කොංග්‍රස් පක්ෂ නායිකා සෝනියා ගාන්ධි ඉන්දීය ආණ්ඩුව තුළ ඒකාධිකාරිය බලයක් දැරූ අතර ඇගේ දේශපාලන අභිලාෂයන්වලට ද ආචාර්ය සිං හට එකඟ වීමට සිදුවිය. ආචාර්ය සිං ගේ රජය දේශපාලන පක්ෂ රැසක් එකතු වූ සහාග රජයක් වීමත් සන්ධානය හවුල්කාරී පක්ෂ ඇතැම් විට විදේශ ප්‍රතිපත්තීන් තීරණය කිරීමේ දී බලපෑම් කිරීම සිදුවිය. ඉන්දීය තමිල්නාඩු ප්‍රාන්තයේ දේශපාලන පක්ෂ හා දෙමළ ඩයස්පෝරාව ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර යුද්ධයට මැදිහත් වන ලෙස බ්‍රිතාන්‍යයෙන් නොයෙක් ඉල්ලීම් සිදු කරන ලදී. ලංකාවේ මානව හිමිකම් යාන්ත්‍රණය පිළිබඳ ආචාර්ය සිං අවධියේ දී ඉන්දියාව සහ බ්‍රිතාන්‍යය සමාන මතවාදයක් දැරූ බවට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ දී බ්‍රිතාන්‍යය සහ ඉන්දියාව ශ්‍රී ලංකාවට එරෙහිව ඡන්දය ලබාදීම තුළින් සනාථ වේ. නමුත් අගමැති මෝදි බ්‍රිතාන්‍යය සමග සබඳතා පැවැත්වීමේ දී කලාපීය රාජ්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී. එයට හේතු වූයේ අගමැති මෝදි හට ඉන්දීය ලෝක්සභාවේ විශාල බහුතර බලයක් හිමි ව තිබූ අතර, එමගින් ඉන්දීය සුළු පක්ෂවලට ඉන්දීය විදේශ ප්‍රතිපත්තින් තීරණය කිරීමේදී බලපෑම් කිරීම සඳහාත් තිබූ ඉඩප්‍රස්ථාව අහිමිව තිබීම යි.

ආචාර්ය සිංගේ දෙවනධුර කාල පරිච්ඡේද අවධියට වඩා මෝදිගේ පළමු ධුරකාල පරිච්ඡේදය තුළ බ්‍රිතාන්‍ය ඉන්දීය විදේශ සබඳතා ශක්තිමත් වූ බවට මා ඉදිරිපත් කළ අදහස සනාථ කිරීම සඳහා මා ඉදිරිපත් කරන තර්ක නම් ආචාර්ය සිංගේ අවධියට වඩා මෝදිගේ අවධිය තුළ දේශපාලන ස්ථාවරයක් පැවතීම, ආචාර්ය සිංගේ දේශපාලන දර්ශනයට වඩා මෝදිගේ දේශපාලන චින්තනය වෙත බ්‍රිතාන්‍ය පාලකයින් ආකර්ෂණීය වීම, බ්‍රෙක්සිට් ක්‍රියාවලි වැනි ගෝලීය දේශපාලන සිද්ධීන් මෝදි බ්‍රිතාන්‍යය වෙත ප්‍රවේශ වීමට අවස්ථාවක් බවට පත්කර ගැනීම,ආචාර්ය සිං අවධියට වඩා පොදු රාජ්‍ය මණ්ඩලිය සමග මෝදි සහයෝගයෙන් කටයුතු කිරීම

හා මෝදී බ්‍රිතාන්‍ය සමග විදේශීය සබඳතා කලාපීය සෙසු රටවල් අතර පවතින සබඳතාවලට බාධාවක් නොකර ගැනීම යන සාධකයි. ඒ අනුව මාගේ මතය වන්නේ ආචාර්ය සිංගේ දෙවනධූර කාල සමයට වඩා මෝදිගේ පළමුධූර කාලය තුළ ඉන්දු බ්‍රිතාන්‍ය විදේශ සබඳතා ධනාත්මක ලෙස වර්ධනය වූ බවයි.

### 3.3 ඉන්දු ඇමරිකානු ආර්ථික සබඳතා

මා ඉන්දු ඇමරිකානු විදේශ සබඳතා ආර්ථික සබඳතා හා දේශපාලන හා මිලිටරි සබඳතා වශයෙන් කොටස් දෙකක් ඔස්සේ ආචාර්ය සිංගේ දෙවනධූර කාල පරිච්ඡේදය හා මෝදිගේ පළමු ධූරකාල පරිච්ඡේදය පදනම් කරගනිමින් සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කරයි.

ආචාර්ය සිංගේ ධූරකාල පරිච්ඡේදය තුළ වාණිජ අමාත්‍යවරයා ලෙස කටයුතු කළ ආනන්ද ශර්මා ඉන්දියා ඇමෙරිකානු වෙළඳ සබඳතා පිළිබඳ අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ඉන්දියා ඇමරිකානු වාණිජ සහයෝගීතාව උපායමාර්ගික වශයෙන් දෙරටට ම වැදගත් වන බවයි (Baffa, 2014). මෙම සමයේ දී ඉන්දියාව ඇමරිකාවෙන් වානේ සැදීමේ ද්‍රව්‍ය, විදුලි සංදේශ උපකරණ, සිවිල් ගුවන්යානා කොටස් සහ එන්ජින් උපකරණ ආදිය ආනයනය කළ අතර ස්වර්ණාභරණ, ඛණිජ ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ඖෂධ හා යපස් ඇමරිකාවට අපනයනය කරන ලදී. ආචාර්ය සිං ගේ ධූර කාලය අවසන් වන විට ඉන්දියාවේ සිට ඇමරිකාවට කළ අපනයනවල ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 21810 වූ අතර ඇමරිකාවේ සිට ඉන්දියාවට සිදුකරන ලද ආනයනවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 41,810ක් විය (United states census burea, 2019). ආචාර්ය සිංගේ ඇමෙරිකානු සංචාරය තුළ දී ජනාධිපති ඔබාමා සමඟ සිදු කරන ලද සාකච්ඡාවල දී ආර්ථික සබඳතා වර්ධනය කර ගැනීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. මාගේ අදහස නම් ආචාර්ය සිං ඇමෙරිකානු වෙළෙඳ සබඳතා ශක්තිමත් කර ගැනීම හරහා උත්සාහ කරනු ලැබුවේ දකුණු ආසියානු කලාපය වෙත ප්‍රවේශ වෙමින් තිබූ චීන වෙළෙඳ අධිකාරිත්වයට අභියෝගයක් එල්ල කිරීමට යි.

අගමැති මෝදි ඉන්දියාවේ ආර්ථික සංවර්ධනය උදෙසා ඇමරිකාවේ වෙසෙන ඉන්දියානු ඩයස්පෝරාවේ සහාය ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ අතර, එහි දී මෝදි සතු පෞද්ගලික දේශපාලන චින්තනය උපයෝගී කරගත් බව මාගේ අදහස යි. ඇමරිකානු ජනාධිපති ට්‍රම්ප් සහ මෝදි දෙදෙනා ම පෞද්ගලික දේශපාලන චින්තනය ජාතිකවාදය මත පදනම් වූ බැවින් හා ට්‍රම්ප් චීන විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ඇමරිකානු වෙළඳාම කෙරෙහි අවධානය යොමු කිරීමට තවත් හේතුවක් විය. මෝදි බලයට පැමිණෙන විටත් චීනය ඉන්දියාවේ අසල්වාසී රටවල් සමඟින් සිය වෙළඳාම ශක්තිමත් කරගෙන තිබූ අතර, චීනය බංගලාදේශයේ චිතගොං වරාය, ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරාය, මාලදිවයිනේ මරාවෝ වරාය හා පාකිස්තානයේ ගුවණ්ඩා වරාය මුල් කොටගෙන වෙළඳාම හා නාවික කටයුතු වර්ධනය කරගනිමින් කටයුතු කරන ලදී. දකුණු ආසියාවේ චීන වෙළඳ ක්‍රියාකාරකම් ඉන්දියාවට මහත් අභියෝගයක් වූ අතර චීන ක්‍රියාකාරකම්වලට අභියෝග කිරීම සඳහා ඇමරිකාව දකුණු ආසියානු කලාපයේ වෙළඳ කටයුතු උදෙසා පාර්ශ්වකරුවකු ලෙස සම්බන්ධ කරගැනීමට මෝදි උත්සාහ කළ බව මාගේ මතයයි. ඇමරිකාව ලංකාවට ඉදිරිපත් කළ M.C.C ගිවිසුම ඉන්දියාවේ පැසසුමට හේතු වූයේ මේ හරහා චීන වෙළඳාමට අභියෝගයක් කිරීම සඳහා හැකියාවක් පවතින බවට විශ්වාස කළ හෙයිනි. චීනය දකුණු ආසියාව එල්ල කරන්නා වූ වෙළඳ ආධිපත්‍යයට ප්‍රතිචාරයක් ලෙස මෝදි ඇමරිකාව සමග එක්ව නැගෙනහිර ආසියානු රටවල් සමග නව වෙළෙඳ සබඳතා වර්ධනය කර ගැනීමට කටයුතු කරන ලදී. ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ සිට මියන්මාරය තායිලන්තය දක්වා ඉදිවන අධිවේගී මාර්ගය පිළිබඳ ඇමරිකාවේ ප්‍රසාදයට ලක් වූයේ ඒ තුළින් චීනය වෙළඳ ප්‍රතිපත්තීන් කෙරෙහි අභියෝගයක් එල්ල කිරීමට හැකියාවක් පවතින හෙයිනි. ඉන්දියාව ඇමරිකාවේ සහය සහිතව වියට්නාමයේ ඛණිජ තෙල් නිධි පරීක්ෂා කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට කටයුතු කරනු ලැබුවේ චීන වෙළඳ ප්‍රතිපත්තිවලට අභියෝගයක් කිරීම උදෙසාය. 2019 අවසන් වන විට ඉන්දියාවේ සිට එක්සත් ජනපදයට සැපයූ භාණ්ඩවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 58ක් ද සේවා අංශයේ සැපයුම ඇමරිකානු ඩොලර් බිලියන 30ක් වූ අතර ඇමරිකාවේ සිට ඉන්දියාවට සැපයූ භාණ්ඩවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 24 හා සේවාවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 34 විය (අයර්ස්, 2020). මෝදිගේ පළමු ධූර කාල අවධියේ දී ඉන්දියානු ඇමරිකා වෙළඳ සබඳතා ධනාත්මක ලෙස වර්ධනය වී තිබූ ආකාරය නිරීක්ෂණය වේ. මාගේ අදහස නම් ආචාර්ය සිංගේ ධූර කාලයට වඩා මෝදිගේ පළමුධූර කාලය තුළ ඉන්දු ඇමෙරිකානු වෙළෙඳ සබඳතා වර්ධනයක් දක්නට ලැබෙන අතර එයට හේතු වනුයේ මෝදිගේ ජාතිකවාදී දේශපාලන චින්තනය කෙරෙහි ඇමරිකානු පාලකයින් යහපත් ප්‍රතිචාර දැක්වීමත් ඉන්දියානු ඩයස්පොරාවේ සහය ලබාගැනීමත් දකුණු ආසියානු කලාපය වෙත අමෙරිකානු වෙළඳාම ප්‍රවේශ කර ගැනීම සඳහා ඉන්දියාව සහාය ලබා දීම වැනි සාධක වේ.

### 3.4 ඉන්දු ඇමරිකානු දේශපාලන හා මිලිටරි සබඳතා

ආචාර්ය සිං ඇමරිකාවේ කළ සංචාරයක් තුළ දී කලාපීය ආරක්ෂක මූලෝපායන් පිළිබඳ සාකච්ඡාවට බඳුන්විය. 2010 ජූලි මාසයේ දී ඇමෙරිකා රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් ප්‍රකාශ කර සිටියේ ඉන්දියාවේ අත්‍යවශ්‍ය ආරක්ෂක සහකරුවකු බවට අමෙරිකාව පත්ව සිටින බවයි. මාගේ අදහස නම්

චීන බලය උපක්‍රමශීලීව පාලනය කිරීම සඳහා ඇමෙරිකාව සිය ආරක්ෂක මූලෝත්පායික පියවරක් ලෙස ඉන්දියාව උපයෝගී කරගත් බවයි. ආචාර්ය සිං ප්‍රකාශ කර සිටියේ 2009 වන විට ඇට්ලන්ටා සහ සියැටල්වල අමතර කොන්සල් කාර්යාලයන් විවෘත කරන බවයි (Ministry Of External Affairs India, 2009). එහි දී ආචාර්ය සිං ඇමරිකාව සමග නව රාජ්‍යතාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගැනීම සඳහා උත්සාහ කළ බව නිරීක්ෂණය වේ. ඉන්දීය ඇමරිකානු න්‍යෂ්ටික සහයෝගීතාව පිළිබඳ අදහස් දැක් වූ ඉන්දියානු බලශක්ති ලේකම් අනිල් රාස්දානි ප්‍රකාශ කර සිටියේ සිවිල් න්‍යෂ්ටික ගිවිසුමේ සැබෑ වාසිය නම් ඉන්දියාව න්‍යෂ්ටික බලාගාර උත්පාදනය සඳහා ඉන්ධන සහය ලබා ගැනීම බවයි (Roche, 2015). නමුත් මගේ අදහස නම් මෙම න්‍යෂ්ටික වැඩපිළිවෙල ඉන්දියාව අසල්වාසී පාකිස්ථානයේ මෙන් ම චීන තර්ජන පිටුදැකීම සඳහා උපයෝගී කරගත් බවයි. එසේම ඉන්දියාව ඇමරිකාව සමග ආරක්ෂක සහයෝගීතාවන් ඇති කරගැනීම තුළින් පාකිස්තානය ඊට ප්‍රතිචාර ලෙස චීනය සමඟ තම සබඳතා වර්ධනය කර ගැනීමට උත්සාහ කළ බවයි.ඉන්දියාවේ කලාපීය නායකත්වය සඳහා අභියෝගයක් එල්ල විය. ආචාර්ය සිං විදේශ ප්‍රතිපත්ති තීරණය කිරීමේ දී පද්ධතිමය විචල්‍ය  සහ දේශීය විචල්‍යයට ප්‍රමුඛ තැනක් ලබා දී ඇති බව දක්නට ලැබේ. එනම පද්ධතිමය විචල්‍යයට අනුව කලාපය තුළ චීන ක්‍රියාකාරකම් හා පාකිස්තාන බලපෑම්වලට ප්‍රතිචාරයක් ලෙස ඇමරිකානු සබඳතා වර්ධනය කරගැනීමට උත්සාහ කළ අතර දේශීය විචල්‍යට අනුව ගත්කල ඉන්දියානු අභ්‍යන්තරයෙන් ගොඩනැගුණු චීන විරෝධය ද මෙයට හේතු විය.

මෝදී බලයට පත් වීමෙන් පසු ඉන්දු ඇමරිකානු සබඳතා ධානාත්මක අවධියකට පරිවර්තනය වූ බව මාගේ අදහස යි. ඇමෙරිකානු ජනාධිපති ඔබාමා 2015 ඉන්දියානු ජනරජ දිනයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. මෝදි බලයට පත් වූ මුල් කාලයේ ඉන්දියාවේ සංචාරයක නිරත වුණ ඇමෙරිකාවේ ආරක්ෂක ලේකම් ඈෂ්ලි කාටර් ඉන්දියාව සමග නව ආරක්ෂක සබඳතා වර්ධනය කර ගන්නා බව ප්‍රකාශ කරන ලදී (කුමාර්, 2016). මෝදී සහ ට්‍රම්ප් අතර සබඳතා ඉතා සුවිශේෂී වන්නේ දෙදෙනා ම ජාතිකවාදී දේශපාලන චින්තනයකින් ප්‍රවේශ වූ නායකයන් වීම නිසාය. මෙම මෝදීගේ දේශපාලන චින්තනය ඉන්දු ඇමරිකානු සබඳතා නව දිශානතියකට යොමු කිරීමට හේතු වූ බව මාගේ අදහස යි.මෝදීගේ ජාතිකවාදී දේශපාලන චින්තනය හරහා ඇමරිකාවේ සිටින ඉන්දීය ඩයස්පෝරාව තම රටට ආකර්ෂණය කර ගැනීමට මෝදිට හැකි විය. ඇමරිකාව සමග මෝදී ලොජිස්ටික් ගිවිසුම, තොරතුරු සන්දේශ ගිවිසුම් හා ආරක්ෂක සහයෝගීතාව යන ද්විපාර්ශික ගිවිසුම් කිහිපයකට අත්සන් කරන ලදී (කුමාර්, 2016). මාගේ අදහස නම් අගමැති මෝදි ට්‍රම්ප් ජනාධිපතිගේ චීන විරෝධී ආකල්ප තම දේශපාලන වාසියට පරිවර්තනය කර ගත් බවයි. එහි දී ඇමෙරිකාව වැඩි වශයෙන් තම කලාප වෙත ආකර්ෂණය කර ගැනීමට කටයුතු කළ අතර, මෙමගින් මෝදි චීන බලය උපක්‍රමශීලීව පාලනය කිරීමට උත්සාහ ගත් බව පෙනේ. මෙහි දී මෝදිගේ ඇමරිකානු සංචාරය තුළදී ජනාධිපති ට්‍රම්ප් ඉහළ පිළිගැනීමක් ලබා දීම තුළින් ද මෝදී කෙරෙහි පවතින සුවිශේෂී කැමැත්ත නිරූපණය වේ.

## 4. නිගමන සහ නිර්දෙශ

මාගේ අදහස  නම් ආචාර්ය සිංගේ දෙවනධුර කාල පරිච්ඡේදයට වඩා මෝදිගේ පළමු ධුර කාල පරිච්ඡේදය තුළ ඉන්දියා ඇමරිකානු සබඳතා ධනාත්මක ලෙස වර්ධනය වූ බවයි. එයට හේතුන් ලෙස මා ඉදිරිපත් කරනු ලබන සාධකයන් වන්නේ අගමැති මෝදි සහ ඇමරිකානු ජනාධිපති ට්‍රම්ප් දෙදෙනා ම ජාතිකවාදී දේශපාලන චින්තකයන් වීම හා ආචාර්ය සිංගේ යුගයට වඩා මෝදි සිය ජාතිකවාදී දේශපාලන චින්තන උපයෝගී කරගනිමින් ඉන්දීය ඩයස්පොරාවේ සහාය තම රටට ලබා ගැනීමට කටයුතු කීරීමයි. ආචාර්ය සිං ඇමරිකාව සමග ධනාත්මක සබඳතා පැවැත්වුව ද කලාපයේ සෙසු රාජ්‍යයන් සමග පැවැති සබඳතා දුර්වල මට්ටමක පැවතුන අතර එයින් ප්‍රයෝජන ගත් චීනය කලාපය වෙත උපක්‍රමශීලීව ප්‍රවේශ වීය.නමුත් අගමැති මෝදි කලාපීය රාජ්‍යයන් සමඟ සුහදව මිත්‍රශීලී සබඳතා පවත්වමින් චීන ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ඇමරිකාවේ සහයෝගය ලබා ගන්නා ලදී.  මාගේ මතය වන්නේ ඉහත හේතුන් නිසා ආචාර්ය සිංගේ  දෙවන ධුර කාලයට වඩා මෝදිගේ පළමු ධුරකාල පරිච්ඡේදය තුළ ඇමරිකානු ඉන්දියානු සබඳතා ධනාත්මක වර්ධනයකට ලක් වූ බවයි.

ආචාර්ය සිංගේ දෙවන ධුරකාල පරිච්ඡේදයේ බ්‍රිතාන්‍ය ඉන්දියානු විදේශ සබඳතා විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ ආර්ථික, දේශපාලන හා මිලිටරි සබඳතා ධනාත්මක තත්ත්වයක පසු වූ බවයි. විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දී ආචාර්ය සිං අභ්‍යන්තර සාධක සඳහා ප්‍රමුඛත්වයක් ලබා දුන් අතර, එයට හේතුව ලෙස මාගේ මතය නම් කොංග්‍රස් පක්ෂ නායිකා සෝනියා ගාන්ධිගේ දේශපාලන ඒකාධිකාරීත්වයේ රජයේ සන්ධානගත දේශපාලන පක්ෂවල බලපෑමයි. මීට සාපේක්ෂව අගමැති මෝදිගේ පළමු ධුරකාල පරිච්ඡේදය දෙස නිරීක්ෂණය කිරීමේ දී මාගේ අදහස නම් ආචාර්ය සිංගේ දෙවන ධුරකාල පරිච්ඡේදයට වඩා ඉන්දු බ්‍රිතාන්‍ය විදේශ  සබඳතා ශක්තිමත් ලෙස වර්ධනය වූ බවයි. මාගේ අදහස සනාථ කිරීම සඳහා මා ඉදිරිපත් කරන තර්කයන් වනුයේ මෝදිගේ දේශපාලන චින්තනය කෙරෙහි බ්‍රිතාන්‍ය අගමැතිවරුන් වන කැමරන් සහ තෙරේසා මේ පිළිබඳ දැඩි කැමැත්තකින් පසු වූ බවත්, අගමැති කැමරන් මෝදිගේ බ්‍රිතාන්‍ය සංචාරය පිළිබඳ සිය ස්වයං චරිතාපදානය තුළ දැක් වූ අදහස් තුළින් ද අගමැති තෙරේසා ඉන්දියාවට පැමිණි අවස්ථාවේ දී බ්‍රිතාන්‍යය සාම්ප්‍රදායික ඇඳුමකින් සැරසී කෝවිලක

උත්සවයකට සහභාගි වීම මගින් නිරූපණය වේ. මෝදි ජාතිකවාදී දේශපාලන චින්තනය ඔස්සේ බ්‍රිතාන්‍යයේ සිටින ඉන්දියානු ඩයස්පෝරාව තමන් වෙත ආකර්ශෂණය කර ගනිමින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා එම ප්‍රජාව දායක කර ගැනීමට කටයුතු කරන ලදී.ආචාර්ය සිංට වඩා අගමැති මෝදී පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ ධනාත්මක සබඳතාවක් පැවැත් වූ අතර බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත් වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ වෙළෙඳපොළ කෙරෙහි ඉන්දියාව ප්‍රවේශ කිරීම්ටත් ඒ තුළින් ආර්ථික වාසි ලබා ගැනීමට මෙන් ම බ්‍රිතාන්‍යය සමග තිබූ ආරක්ෂාව තවත් වර්ධනය කර සබඳතා වර්ධනය කර ගැනීමට උත්සාහ කරන ලදී. ඉහත කරුණු මගින් ආචාර්ය සිංගේ දෙවන ධුරකාල පරිච්ඡේදයට වඩා මෝදිගේ පළමු ධුරකාල පරිච්ඡේදය තුළ ඉන්දු බිතාන්‍ය විදේශ සබඳතා ශක්තිමත් වූ බව ප්‍රකාශ වූ මාගේ අදහස සනාථ කොට ඇත.

ආචාර්ය සිං දෙවන ධුරකාල පරිච්ඡේදය තුළ ඉන්දු ඇමරිකානු විදේශ සබඳතා විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ එම සබඳතා ධනාත්මක තත්ත්වයක පැවති බවයි. 2011 වසරේ දී ඉන්දියාවට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයත් සමග ඇමරිකාව සමඟ නව ආරක්ෂක සබඳතා වර්ධනය කර ගැනීම සඳහා ආචාර්ය සිං පෙළඹුණ අතර, මේ මගින් පාකිස්ථානය සහ චිනය වෙත පීඩනයක් එල්ල කිරීම අරමුණ වුව ද ආචාර්ය සිංගේ කලාපීය සබඳතා දුර්වල තත්ත්වයක පැවති අතර, ඒ තුළින් චීනය උපක්‍රමශීලීව කලාපයේ සෙසු රටවල් සමඟ ආර්ථික හා දේශපාලන සබඳතා වර්ධනය කර ගැනීමට කටයුතු කරන ලදී. ජනාධිපති ඔබාමා නැගෙනහිර ආසියාව සමඟ සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා ගෙනගිය සැලැස්ම සඳහා ඉන්දියාවේ සහය ලබා දෙන ලදී. නමුත් මාගේ මතය ඉන්දු ඇමරිකානු සබඳතා ආචාර්ය සිංගේ දෙවන ධුරකාල පරිච්ඡේදයට වඩා අගමැති මෝදිගේ පළමුවන ධූර කාල පරිච්ඡේදය තුළ ශක්තිමත්ව වර්ධනය වූ බවයි.

එය සනාථ කිරීම සඳහා මා ඉදිරිපත් කරන තර්ක නම් අගමැති මෝදිගේ ජාතිකවාදී දේශපාලන චින්තනය කෙරෙහි ජනාධිපති ඔබාමා සහ ජනාධිපති ට්‍රම්ප් කැමැත්තකින් පසු වූ බවත් නිරීක්ෂණය වන අතර ජනාධිපති ට්‍රම්ප් ජාතිකවාදී දේශපාලන චින්තනයකින් දේශපාලනයට පිවිසි නායකයකු වීමත්, මෙම සබඳතා තවත් වර්ධනය වීමට හේතුවක් විය. අගමැති මෝදි තම දේශපාලන චින්තනය උපක්‍රමශීලීව යොදාගනිමින් ඇමරිකාවේ සිටින තම ඩයස්පෝරාව තමන් වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා කටයුතු කරන ලදී. චීනය කලාපය තුළ ක්‍රියාත්මක කරන්නා වූ ආර්ථික හා දේශපාලන බලයන් උපක්‍රමශීලීව පාලනය කිරීම සඳහා අගමැති මෝදි ඇමෙරිකානු සබඳතා උපයෝගී කරගත් අතර ජනාධිපති ට්‍රම්ප් චීන විරෝධීයකු වීම ඔහුගේ මෙම ක්‍රියාවට මහත් පිටුවහළක් විය. ඉහත කරුණු මගින් මා ඉදිරිපත් කළ ආචාර්ය සිං ගේ දෙවන ධුරකාල පරිච්ඡේදයට වඩා මෝදිගේ පළමු ධුරකාල පරිච්ඡේදය තුළ ඉන්දු ඇමරිකානු විදේශ සබඳතා ශක්තිමත් ලෙස වර්ධනය වූ බව ප්‍රකාශ වන අදහස සනාථ වේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


Ayres, A. (13 February 2020). *A Field Guide to U.S.-India Trade Tensions*. Google.com; Council on Foreign Relations. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.cfr.org/article/field-guide-usindia-trade-tensions&ved=2ahUKEwj9-8vVocvyAhUPSX0KHXtCAkoQFnoECCgQAQ&usg=AOvVaw3Jx5WndH8U7SFHzJkMFjBs

Baffa, C. (2013). *United States-India Trade Relations*. Google.com; Asia Briefing. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.asiabriefing.com/news/2013/07/united-states-india-trade-relations/&ved=2ahUKEwih78rXosvyAhWgUfUHHYurAWg4ChAWegQIBhAB&usg=AOvVa w03qO0_NrdruHOzBllvVkTd

BBC News. (12 November 2015). The Links between the UK and India. *BBC News*. https://www.bbc.com/news/uk-34767180

BBC News. (12 November 2015). *The links between the UK and India*. BBC News. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.bbc.co.uk/news/uk34767180.amp&ved=2ahUKEwixrubqmrjyAhWJbisKHaUjDJkQFnoECCcQAQ&usg=AOvVaw 0Pe2IjhUnIe7WMBq8M8uh0&cf=1

Cameron, D. (2019). *FOR THE RECORD* (Front cover of the first edition). William Collins.

Council on Foreign Relations. (2021). *U.S.-India Relations*. Google.com; Council on Foreign Relations. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.cfr.org/timeline/usindia-relations&ved=2ahUKEwiyu_-dqcLyAhVXb30KHdkNAYQQFnoECCsQAQ

&usg=AOvVaw0XriIiwgm1fdUKGb2z1BwJ

Desk, I. T. N. (12 November 2015). *Full schedule of PM modi's UK visit*. Www.indiatvnews.com. https://www.indiatvnews.com/politics/national/pm-modi-uk-visit-full-schedule-33741.html

Grove, J. (28 February 2017). *UK-India relationship "at risk" as student numbers slide*. The World University Rankings; The World University Rankings. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.timeshighereducation.co m/news/uk-india-relationship-at-risk-as-student-numbers-slide&ved=2ahUKEwiZ1ID6nLjyAhVTOSsKHe7OBKkQFnoECAwQAQ&usg=AOvVaw0qmN Eja2BE7ZSapAuquVMZ&cshid=1629209152164

Kumar, S. (10 May 2016. *How Modi changed the India–US relationship*. Google.com; East Asia Forum. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.eastasiaforum.org/2016/ 05/10/how-modi-changed-the-india-us-relationship/&ved=2ahUKEwij7aC-5cnyAhXDKqYKHaCCBXk4FBAWegQIBxAB&usg=AOvVaw1WH2uufDlN_zJH1FpgyKl3

Ley, S. (16 Novembre 2016). *India: Theresa May's charm offensive leaves many unmoved*. BBC News; https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.bbc.com/news/ukpolitics-37950198.amp&ved=2ahUKEwjssMSuq8HyAhUZcCsKHVKpClAQFnoECAcQAQ&usg=AOvVaw08PAJTtwYqJqU2am8lunBp&cf=1&cshid=162952250587

Meltzer, J. P. (23 September 2014). *Growing the India-U.S. Trade and Investment Relationship*. Brookings. https://www.brookings.edu/research/growing-the-india-u-s-trade-and-investmentrelationship-2/

Ministry of External Affairs, Government of India. (27 September 2008). *Address by Prime Minister Dr Manmohan Singh to the Indian Community in USA New York*. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.mea.gov.in/outogingvisit-detail.htm%3F1608/Address%2Bby%2BPrime%2BMinister%2BDr%2BManmohan%2BSingh% 2Bto%2Bthe%2BIndian%2BCommunity%2Bin%2BUSA%2BNew%2BYork%2B27%2BSeptem ber%2B2008&ved=2ahUKEwjRjOvo-8PyAhWxW3wKHfVnDmIQFnoECCUQAQ&usg=AOvVaw2_I3z0069WEz4-7Ub1hvi_&cshid=1629612806450

Modi, N. (2019). *Sabka saath sabka vikas* (p. 9728). Publication Divition,Ministry of Information & Broadcasting,Government of India.

Pant, H. V. (7 November 2016). *British PM Theresa May Visits India: What's On the Agenda*.

Google.com; The Diplomat. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://thediplomat.com/2016/11/briti sh-pm-theresa-may-visits-india-whats-on-the-agenda/&ved=2ahUKEwjssMSuq8HyAhUZcCsKHVKpClAQFnoECAkQAQ&usg=AOvVaw0o DkPGDazRGBanYq7RkMWp&cshid=1629522500587

Prasad, K. F. and E. (4 November 2010). *The U.S.-India Relationship*. Brookings. https://www.brookings.edu/research/the-u-s-india-relationship/

Roche, E. (17 July 2015). *How the nuclear deal thawed India-US relations*. Mint. https://www.livemint.com/Politics/dLt18KTAlbla8OZd4zUfpJ/How-the-nuclear-deal-thawedIndiaUS-relations.html

Sandford, A. (2020). *Brexit timeline 2016-2020:key events in the uk's path from referendum to EU exit*.

Sandford, A. (30 January 2020). *Brexit timeline 2016–2020: The uk's path from referendum to EU exit*. Euronews. https://www.euronews.com/2020/01/30/brexit-timeline-2016-2020-key-events-in-theuk-s-path-from-referendum-to-eu-exit

Singh, M. (n.d.). *Changing India*. (Original work published 2019)

Sonwalkar, P. (27 June 2015). *Modi will be the first Indian PM to visit UK in almost a decade*. Hindustan Times; Hindustan Times. https://www.hindustantimes.com/india/modi-will-be-the-first-indianpm-to-visit-uk-in-almost-a-decade/story-ScXCoJGerYL0MZeKZmpK9O.html\

Sruthi R. (4 June 2014). *The Manmohan Doctrine and Narendra Modi's Foreign Policy*. ORF; observer research foundation. https://www.orfonline.org/research/the-manmohan-doctrine-and-narendramodis-foreign-policy/

The White House. (8 November 2010). *The U.S. - India Partnership: the fact sheets*. Google.com; The White House Office of the Press Secretary. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://obamawhitehouse.archives.go v/the-press-office/2010/11/08/us-india-partnership-fact-sheets&ved=2ahUKEwjA9buP5cnyAhUHGKYKHTDPDOI4ChAWegQIBhAB&usg=AOvVaw 1b_IupAerOJ8zsaJpbH2Ju

United States Census Bureau. (2021). *Trade in Goods with India*. Google.com; https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.census.gov/foreigntrade/balance/c5330.html&ved=2ahUKEwih78rXosvyAhWgUfUHHYurAWg4ChAWegQIAxAB&usg=AOvVaw3IyLYrfsCFV_XgFMFmGJB5